# ඇගයීම් සඳහා තරුණයන් සහ තරුණ ඇගයීම්කරුවන් අර්ථවත් ආකාරයෙන් සම්බන්ධ කරගැනීම උදෙසා වන ක්‍රියාමාර්ග සඳහා කැඳවීම

ගෝලීය ඇගයුම් ප්‍රජාවේ සාමාජිකයන් ලෙසින්, රජයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, ඇගයීම් වෘත්තිය උදෙසා වන ස්වේච්ඡා සංවිධාන, එක්සත් ජාතීන්ගේ නියෝජිත ආයතන, ඇගයීම්කරුවන්, අධ්‍යයන ආයතන, පුද්ගලික ආයතන සහ සංවර්ධන ක්ෂේත්‍රය නියෝජනය කරන අපි,

තරුණ හා නැගීඑන ඇගයීම්කරුවන් ගෝලීය ඇගයීම් සංස්කෘතිය ශක්තිමත් කිරීම උදෙසා ක්‍රියාකාරීව දායක වන බවත්, සමාජ සාධාරණත්වය සහ සමානාත්මතාවය වෙතින් සකසා ඇති තිරසාර, සියලු දෙනාගෙන්ම සමන්විත සහ සාධාරණ ලොවක් ගොඩනැගීම සඳහා ඇගයීම පරිවර්තනීය බලය වර්ධනය කරගැනීම සිදුකරන බවත් හඳුනා ගනිමු.

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා සහාය වීම සඳහා, ඇගයීම් ක්‍රියාවලීන්හි සහ ඇගයීම් උපදේශනයේදී තරුණ හා තරුණ හා නැගී එන ඇගයුම්කරුවන්ගේ අර්ථවත් සහභාගීත්වය පෝෂණය කිරීම සහ සහාය දීම සඳහා අපගේ කාර්යභාරය සහ වගකීම පිළිගන්න;

තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීමේ කාර්යභාරයට දායක වීම උදෙසා ඇගයීම් ක්‍රියාවලියේ සහ ඇගයීම් උපදේශන කාර්යයේදී තරුණයින් සහ තරුණ නැගීඑන ඇගයුම්කරුවන්ගේ අර්ථවත් සහභාගිත්වය පෝෂණය කිරීම සහ සහයවීම සඳහා වන අපගේ කාර්ය සහ වගකීම පිළිගනිමු.

තරුණ සහ නැගීඑන ඇගයුම්කරුවන්ගේ වෘත්තීය හැකියාවන් ගොඩනැගීම සඳහා වන උපායමාර්ගික මෙන්ම සාමූහික උත්සහයන් පිළිගැනීම සඳහා කැපවෙමු.

ඇගයීම සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම සහ භාවිතය සඳහා තරුණයින් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමෙන්, තරුණයින්ගේ විවිධත්වය කෙරෙහි අවධානය යොමු කරමින්, ඇගයීමේදී තරුණයින්ගේ සැබෑ හා අර්ථවත් සහභාගීත්වය වෙනුවෙන් පෙනී සිටීමට සහ වැඩි දියුණු කිරීමට කැපවෙමු. මෙයට තරුණ, තරුණ සහ නැගී එන ඇගයුම්කරුවන් ඇගයීමේ සියලු අදියරයන්හි දී සම්බන්ධ කර ගැනීම ඇතුළත් වේ, ඒවා අතර:

- **ප්‍රධාන තොරතුරු සපයන්නන්,** නියෝජනය අඩු මට්ටමක පවතින තරුණ කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, ඇගයීම් දත්ත රැස් කිරීමේදී මාර්ගෝපදේශන සහ සාක්ෂි සැපයීම

- **සම-ඇගයුම්කරුවන්,** ජ්‍යෙෂ්ඨ ඇගයීම් කණ්ඩායම් සාමාජිකයින් සමඟ ඇගයීම් සිදුකරන්නන්.

- **උපදේශකයින්,** ඇගයීම් ක්‍රියාවලියේ ප්‍රධාන බෙදාහැරීම් සඳහා විශේෂිත දැක්මක් සහිතව දායකත්වය දක්වන්නන්.

- **තීරණ ගන්නන්,** ඇගයීම් ක්‍රියාවලිය නියෝජිතයන් සහ/හෝ කළමනාකරුවන් සමඟ එක්ව ඇගයීම් ක්‍රියාවලිය සම-නායකත්වය දරන සහ සම-මඟ පෙන්වීම සිදුකරන්නන්.

- ඇගයීම් භාවිතය සඳහා පෙනී සිටින්නන්

ඇගයීමේදී තරුණ, තරුණ සහ නැගී එන ඇගයුම්කරුවන්ගේ අර්ථවත් මැදිහත්වීම අඛණ්ඩ ක්‍රියාවලියක් බවත්, එක් වරක් පමණක් කළ හැකි උත්සාහයක් නොවන බවත් පිළිගනිමු, ඒ සඳහා ක්‍රියාවලිය පිළිබඳ පරාවර්තනය සහ ක්‍රියාමාර්ග සහ වෙනස්කම් සඳහා පාඩම් භාවිතා කිරීම අවශ්‍ය වේ.

ඇගයීමේදී තරුණයින් සඳහා ශූරයෙකු වීමට අපි/මම කැපවී සිටිමු!

ප්‍රකාශයට අත්සන් තබන්න